චක්‍රලේඛ අංක : 05/2020 (1)

මගේ අංකය :WPCEC/M1/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
ජනජයසිටි ගොඩනැගිල්ල, 08 වන මහල
නාවල පාර
රාජගිරිය
2021.03. 05

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්
සණස සමිති
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>වැඩ බැලීමේ පදනම මත සේවකයන් පත් කිරීම සම්බන්ධව</u>

උක්ත කරුණට අදාලව නිකුත් කර ඇති 5/2020 කොමිෂන් සභා චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, සමුපකාර සේවකයකු තනතුරක වැඩ බැලීම සඳහා පත්කිරීම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන්නේ වසරක ( 01) කාලයකට පමණි.

03. ඊට අමතරව, වැඩ බැලීමේ පත්වීම් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන බව කොමිෂන් සභා නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

I. අදාල තනතුරේ වැඩ බලන වසර 01 ක කාලය තුල දී එම පුරප්පාඩුව ස්ථිර ලෙස සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතු අතර කිසියම් සමිතියක් එලෙස බඳවා ගැනිමට අපොහොසත් වන්නේ නම්, එකී වැඩ බැලීමේ කාලයෙන් පසුව අදාල සේවකයා එම තනතුර සඳහා රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීමට හැකියාව ඇත. එහෙත්,මෙම රාජකාරි ඉටු කිරිමේ පත්කිරීම් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන්නේ වරකට මාස 06 බැගින් උපරිම වසර 02 ක කාලයක් සඳහා පමණි.

II. ඉහත 1 හි සඳහන් වසර 03 ක කාලය තුල දී අදාල තනතුරේ පුරප්පාඩුව අනිවාර්යයෙන් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. එසේ අදාළ පුරප්පාඩුව සම්පූර්ණ කර ගැනිමට විධිමත් පරිදි කටයුතු නොකළහොත් ඒ පිළිබඳව සමිතියේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

එල්.පී. මනෝජා එස් පතිරණ
ලේකම්, (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත